අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
**Ministry of Internal Affairs, Wayamba Development & Cultural Affairs**

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
## குடிவரவு, குடியகல்வுத் திணைக்களம்
**DEPARTMENT OF IMMIGRATION & EMIGRATION**

"සුහුරුපාය" ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சுஹுருபாயா", ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை, இலங்கை.
"Suhurupaya", Sri Subhuthipura Road, Battaramulla, Sri Lanka
E-mail: controller@immigration.gov.lk

තැ.පෙ. / த.பெ. இல. / P.O. Box } 586

මගේ අංකය / எனது இல. / My No. } DIE/CIT/CC/30/2017

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 18.08.2017

රෝහණ හෙට්ටිආරච්චි මයා,
විධායක අධ්‍යක්ෂක,
පැෆරල් සංවිධානය,
අංක 12/3, රොබට් ටෙරසය,
රොබට් ගුණවර්ධන මාවත,
කොළඹ 06.

**<u>RTI 009 - ද්විත්ව පුරවැසි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම</u>**

තොරතුරු දැනගැනීමේ පනතට අනුව ඉහත අංකය යටතේ 2017.05.17 වන දින මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ඔබගේ තොරතුරු ඉල්ලුම් පත්‍රය හා බැඳේ.

02. ඒ අනුව ද්විත්ව පුරවැසිභාවය පරීක්ෂා කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ නම්, උපන් දිනයන් හා ජාතික හැඳුනුම්පත් අංකයන් සහිත නාම ලේඛනයක් පාර්ලිමේන්තු මහලේකම්තුමා වෙතින් 2017 ජූනි 06 වන දින මා විසින් ලබා ගන්නා ලදී.

03. එම ලේඛනයේ සඳහන් තොරතුරු මෙම දෙපාර්තමේන්තුවේ ද්විත්ව පුරවැසිභාවය ලබාගත් අයගේ තොරතුරු අන්තර්ගතව ඇති පරිගණක පද්ධතියට ඇතුලත් කර එම තොරතුරු හා සසඳන ලදී.පරිගණක පද්ධතිය නිර්මාණය කිරීමට පෙර ප්‍රදානය කරන ලද ද්විත්ව පුරවැසිභාවයන් පිළිබඳ තොරතුරු ඇතුලත් ලේඛන මාගේ උපදෙස් මත ඒ සඳහා පත් කරන ලද සහකාර පාලකවරුන් මගින් පරීක්ෂා කරන ලදී.

04. මෙහිදී ඔබ සංවිධානය විසින් එවන ලද ලිපියෙහි අංක 72 හි නම් සඳහන්ව ඇති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය හට පමණක් ද්විත්ව පුරවැසි භාවය හිමිව ඇති අතර ඒ සඳහා අංක 17096A දරණ ද්විත්ව පුරවැසි සහතිකය නිකුත් කර ඇති බව දන්වා සිටිමි.

05.කෙසේ වෙතත් මෙම පරීක්ෂාවන් දෙකෙහි දීම අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් 224 දෙනා සඳහා ද්විත්ව පුරවැසි සහතික නිකුත් කොට නොමැති බව සනාථ වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

එම්.එන්.රණසිංහ
පාලක ජනරාල්

පිටපත : තොරතුරු නිලධාරි (නීති අංශය)

දුරකථන/தொலைபேசி / Telephone

ක්ෂණික ඇමතුම් / உடன் அழைப்பு / Hotline } 1962

පොදු / பொது / General } 5329000

ෆැක්ස් / பக்ஸ் / Fax } 2674621

# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

## PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


2017.08.24

ප්‍රවෘත්ති කර්තෘ/සංස්කාරක,

**පාර්ලිමේන්තු මන්ත්‍රීන් අතරින් ද්විත්ව පුරවැසිභාවය ගීතා කුමාරසිංහ මහත්මියට පමණයි, ආගමන විගමන පාලක තහවුරු කරයි.**

පසුගිය කාල සීමාව තුල රට තුල ප්‍රබල සංවාදයක් නිර්මාණයක් කරන්නට සමත් වූ ප්‍රමුඛ මාතෘකා අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ද්විත්ව පුරවැසි භාවය පිළිබඳ කාරණය සුවිශේෂී වැදගත්කමක් උසුලයි. මෙකී ආන්දෝලනාත්මක කරුන පිළිබඳව වගකීමක් සහිත සිවිල් සංවිධානයක් මෙන්ම මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස සැබෑ තොරතුරු අනාවරණය කරගැනීම අපගේ වගකීමක් බව විශ්වාස කරනු ලැබූ හෙයින් ද්විත්ව පුරවැසිභාවය සහිත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කවුරුන්ද යන්න විමසා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත තොරතුරු දැනගැනීමේ පනත යටතේ අයදුම්පත්‍රයක් යොමු කරන ලදී. (RTI 009)

එයට ප්‍රතිචාර දක්වමින් ආගමන විගමන පාලකවරයා විසින්, සියළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම්, උපන් දිනයන් හා ජාතික හැඳුනුම්පත් අංකයන් සහිත නාම ලේඛනයක් පාර්ලිමේන්තු මහා ලේකම්වරයාගෙන් ගෙන්වා ගෙන පරීක්ෂාවට ලක්කොට ඇත. ඒ අනුව එම ලේඛනයේ සඳහන් තොරතුරු ආගමන විගමන දෙපාර්තුමේන්තුවේ ද්විත්ව පුරවැසිභාවය ලබාගත් අයගේ තොරතුරු අන්තර්ගත කොට ඇති පරිඝනක පද්ධතියට ඇතුලත් කොට පරීක්ෂා කර ඇති අතර එයින්ද නොනැවති පරිඝනක පද්ධතිය නිර්මාණය කිරීමට පෙර ද්විත්ව පුරවැසිභාවය ප්‍රධානය කල පුද්ගලයින්ගේ තොරතුරු ඇතුලත් ලේඛනද වැඩිදුරටත් පරීක්ෂා කිරීමට කටයුතු කර තිබේ.

එම පරීක්ෂාවෙන් අනතුරුව ආගමන විගමන පාලකවරයා විසින් සනාථ කොට ඇත්තේ ගාල්ල දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මියට පමණක් අංක 17096 A දරන ද්විත්ව පුරවැසි සහතිකය නිකුත් කොට ඇති බවයි. එමෙන්ම මෙකී පරීක්ෂාවේදී අනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 224 දෙනා සඳහා ද්විත්ව පුරවැසි සහතිකයන් නිකුත් කොට නොමැති බවට සනාථ වන බව ආගමන විගමන පාලකවරයා විසින් අප වෙත දන්වා එවා ඇත.

ඒ අනුව වගකිව යුතු නිරීක්ෂණ සංවිධානයක් ලෙස විධිමත් තහවුරු කර ගැනීමකින් පසුව මෙම ආන්දෝලනාත්මක කාරණයට අදාල සැබෑ තොරතුරු සමාජය හමුවේ තැබීම අපගේ වගකීමක් බව විශ්වාස කරන හෙයින් උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ හා පුරවැසියන්ගේ දැනගැනීම පිණිස එම තොරතුරු මාධ්‍ය වෙත යොමු කිරීමට අප තීරණය කලෙමු.

මෙම තොරතුරු ලබාදීම සඳහා අප සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යමින් කාර්යක්ෂම හා අමිල මෙහෙවරක් ඉටු කල ආගමන විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු නිලධාරීවරයාට හා ආගමන විගමන පාලකවරයාට අපගේ කෘතවේදීත්වය පලකර සිටිමු.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක


# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2514441 / 11 2514442 Fax: (+94) 11 2514443
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk